

# සිංහල බෞද්ධ රාජ්‍ය සම්ප්‍රදාය

මතුගම සෙනෙවිරුවන්

13

# මුස්ලිම් ජනතාවට ලංකාවේ ඉඩ ලැබුණු හැටි

දහතුන් වන සියවස ගෙවී යත්ම ලෝකයේ මහා බල අරගලයක පෙර නිමිති පහළ වන්නට විය. යුරෝපීයන් ද මුස්ලිම් වාණිජයන් ද තකට තක සිට සාගරයේ බලය තහවුරු කරමින් පෙරදිගට ඇදී එන්නට විය. මෙය සාමකාමී ලෝකයට කොහෙත්ම සුබ දායී ආරංචියක් නොවී ය. නමුත් එවකට පැවති පරිදි නවීන නාවුක යාත්‍රාවලින් සන්නද්ධ වූ පෘතුගීසින් යුරෝපයේ සිට පෙරදිග බලා පැමිණියේ මුස්ලිම් වාණිජ බලය සතු ඉසව් ජයග්‍රහණය කරගන්නටයි. මුස්ලිම් කණ්ඩායම් ඉන්දියාව ආක්‍රමණය කරමින් එහි සිට ආර්ය රජවරු සමූල ඝාතනය කරමින් සිය ආධිපත්‍ය පිහිටවූ අතර ඉන්දියාව පුරාම ඉස්ලාම් ආගම පැතිරෙන්නට විය. දකුණ ඉන්දිය ද්‍රවිඩයන් පමණක් නොව ඇතැම් රාජ වංශිකයන් පවා ඉස්ලාම් ආගම වැළඳ ගත් බව ඉතිහාසයේ සඳහන් ය.

ඉන්දියාවේ මුස්ලිම් පාලකයන් සමග සටන් වැදුණු හින්දු පාලකයන් අවසානයේ මුස්ලිම් ජනයා සමග සමගි සන්ධාන ගත වූයේ, තම කුමරියන් මුස්ලිම් ජනයාට පාවා දීමෙනි. මෙයට විරුද්ධව දකුණේ හින්දූන් මහා බලගතු රාජ්‍යයක් පිහිට වූ අතර ලංකාවට ද ඉන් විශාල බල පෑමක් එල්ල විය. ක්‍රි.ව. 1287-1250 අතර කාලයේ ලංකාවේ රජ කළ සතරවන විජයබාහු රජු මේ නිසා උතුරු ඉන්දියාවේ රාජ්පුත් වංශිකයින් සමග සමගි සන්ධාන ගතව සිටි බව පෙනේ. මෙහි ප්‍රතිඵලය වූයේ ලංකාවේ රජුට රාජ්පුත් වංශික ආරක්ෂක සේනාවක් ද වීම යි.



මේ තත්වය තුළ රජ වාසලේ යම් නොසන්සුන්තාවයක් ඇති විය. රජුගේ සෙනෙවි මිත්‍ර රජුට එරෙහිව කුමන්ත්‍රණය කොට රාජ්‍ය ගැනීමට තැත් කළේ ය. නමුත් රාජ්පුත් ඒකුරක එය වළක්වා මිත්‍ර සෙනෙවි මරා විජයබාහුගේ පුත් බුවනෙකබාහුට රාජ්‍ය ලැබ දුන්නේ ය. මෙවකට රාජ්පුත් වංශිකයන් ඉස්ලාම් ආගම වැළඳ ගෙන තිබුණි. රජු ඔවුන්ගේ කෙනෙකු උපදේශකයෙකු ලෙසට තබා ගත්තේ ය. මොහුගේ අනුදැනුම ඇතිව අල්හාජ් අබු උ ඊමන් නම් දූතයෙකු 1283 දී ඊජිප්තුවේ රජ වාසලට දූත ගමනක් ද යැවීය. රජු මේ දූතයා අත යවන ලද ලිපියේ මෙලෙස සඳහන් වේ.

'ලංකාව ඊජිප්තුව යි. ඊජිප්තුව ලංකාව යි. මගේ දූතයා ආපසු එන විට ඊජිප්තුවේ දූතයෙකු ඔහු සමග එනු ඇත කියාත් දූතයෙකු ඒඩන් නගරයේ වාසයට එනු ඇත කියාත් මම බලාපොරොත්තු වෙමි. හැම වර්ගයකම මැණික් අති විශාල ප්‍රමාණයක් මා සතුව තිබේ. නැව් ඇතුන් මුස්ලින් රෙදි අගිල් සහ කුරුඳු වැනි සියලු වාණිජ වස්තූන් ද වෙළෙන්දන් විසින් ඔබ වෙත ගෙන එනු ලැබේ. තෝමර තැනීමට සුදුසු ලී ඇති ගස් මගේ රාජ්‍යයේ වැවෙයි. අවුරුදු පතා නැව්



(-වත්හිමි කුමරා)*

විස්සක් එවන්නයි සුල්තාන්තුමා මට කියතොත් ඒවා සැපයීමට මට පුළුවන. තවද එතුමාගේ විජිතවල වෙළෙන්දන්ට මාගේ රාජ්‍යයේ වෙළෙඳාම් කිරීමට පැමිණීමට සම්පූර්ණ නිදහස තිබේ.' මේ තත්වය මත රාජ්පුත් කුමරියක් තම දෙවනි බිසවක් ලෙසට තබා ගත්තේ ද රාජ්පුත් බලය රජුට ශක්තියක් වූ බැවිනි

* ඡායාරූපය ගලේබණ්ඩාර දේවාලයේ කපු මහතාගේ කාරුණික අනුග්‍රහයෙනි.

යයි කල්පනා කළ හැකි ය. මේ අනුව එම බිසවට වත්හිමි නම් පුත්‍රයෙකු ද ඇති විය.*

ඉන්දියාවේ චාලුක්‍ය රජ පෙළපත අවසාන වූවායින් පසුව දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය හොයිසාල් කාකටීය හා යාදව රාජ වංශයන් වශයෙන් රාජධානි හතරක් ඇති විය. 1268 දී පාණ්ඩ්‍ය දේශයේ රජු බවට පත් මාරවර්මන් කුලශේකරගේ අමාත්‍යවරයා බුවනෙකබාහු රජුගේ කාලයේදී ලංකාව ආක්‍රමණය කොට යාපහුව වටලා රජු මරා දමා දළදා පාත්‍රා ධාතුව ද පැහැර ගෙන පාණ්ඩ්‍ය දේශයට ගියේ ය. මේ අවස්ථාවේදී අරාජික වූ රාජ්‍ය තුළ සිහසුනට පත් වීමට වත්හිමි කුමරුට සහාය දක්වන ලද්දේ මුස්ලිම් වෙළෙඳ බලය විසිනි. බුවනෙකබා රජුගේ අග

---

*

සිව් වන විජයබා ලක සිහසුනේ නැග-
උස් ගුණයෙන් රුවින් සිරි දිනු බිසව් අග
කුස් ඉපදුණු පුතුගෙ මන තොසමින්ම මග-
දොස් ඇති හැමද මිහිලොල් වී ගිය නොමග

අස් අද්දන දෙපියයුරු පැරයූ රණ හස-
තොස් මද්දන දෙතොල රති ගහන රන කුස
ඉස් මද්දන තිපස් සද මතිනි රති ලොස-
අස් වැද්දුම ගමෙහි යෝනක මියුලස

යෝනක ළඳගෙ පුත් වත් හිමි බණ්ඩාර-
මේ ලක රජ ලොබින් ඔහු සිත අත් නැර
ජානක සිය ලෙසින් ඒ වන සංචාර-
නේ දුක් විඳි කුමරු පැරකුම් පින්සාර

උරුම නැති රජය කළ මුත් අහිමි හිමි-
කරුම විලස පෙරලා සිය හිමිට හිමි
අරුම පිරිත් මණ්ඩප කර බිමට හිමි-
මරුම පැමිණි කිවි දිව්වත් හිමිගෙ හිමි

කිරුළ හිමි කුමරු පිය රජුගෙ වරදින-
පෙරළ වෙස් කළුන්දෑ නම් ගම් ගොසින
කසල ගොඩට මැණිකක් සේම වන-
එකල කුමරු වත් හිමි මෙපුර රජ වුන



බිසවගේ පුත් කුමරා ළදරු වියේ සිටීම මෙයට හේතුව යි. ඔවුහු බේරුවල ප්‍රදේශයේ මාළිගයක් තනවා වත්හිමි කුමරා ආරක්ෂා කොට කල්යල් බලා කුමරුට රාජ්‍ය අත්පත් කර දුන්හ. කලුන්දෑ පටුන හා සිරිමල් එතනා නාඩගම දක්වන පරිදි ඉතා කෙටි කලක් වත්හිමි කුමරා රාජ්‍ය විචාළ බව පෙනේ.



(-ගලේ බණ්ඩාර දේවාලය)

දුරාතීතයේ සිට ම බෞද්ධ රාජ්‍යයක් ලෙසට පැවතුණු ලංකාව මුස්ලිම් රටක් බවට පත් වීමේ අවදානම වටහා ගත් භික්ෂූන් වහන්සේලා මේ උගුලෙන් ගැලවීම පිණිස ජාති හිතෛෂී නිලධාරීන් සමග කතිකා කොට ගෙන කුමන්ත්‍රණයක් ලක ලෑස්ති කළහ. මේ අවදියේදී කුරුණෑගල වැවේ රන් සෙම්බුවක් මතු වෙමින් යට යන බවට ආරංචියක් පැතිර ගියේ ය. වස්තු ලෝභයෙන් හරිත වත්හිමි මෙය ගැනීමට ඇමතියනට අණ දුන්නේ ය. මෙහිදි බෝයගනේ නම් මහ නායක තෙර නමක් මූලික වී රජු නිලයෙන් පහ කිරීමට මේ අවස්ථාව යොදා ගත්තේ ය. මේ රන් සෙම්බුව ගැනීමට කුරුණෑගල ගල උඩ පිරිත් දෙසුමක් කල යුතු යයි රජුට ඒත්තු ගැන්වූ පිරිස ගල උඩ රෝද සවි කරන ලද පිරිත් කොටුවක් සකස් කළේ ය. අනතුරුව පිරිත්

දෙසුම දිනයේ දි රජු ඒ ස්ථානයට කැඳවා ගෙන පැමිණ අසුන් ගැන්වූයේ ය. පසුව රජුට නොදැනෙන්නට රැහැන් කපා දමා පිරිත් කොටුව ද සමගින් රජු ගලෙන් පහළට පෙරලා ජීවිතක්ෂයට පත් තළ බව සඳහන් ය. වත්හිමි බණ්ඩාර මණ්ඩපය ද සමගින් ගල පහළට පෙරලී ගලේ බණ්ඩාර නමින් යක්ෂ ආත්මයක් ගත් බව සඳහන් ය. අදත් මේ ගලේ බණ්ඩාර දේවාලය කුරුණෑගල ගල පාමුල තිබේ.

ලංකාවේ රාජ වංශය මුස්ලිම් වීම වැලැක්වීම ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ සිදු වීමකි. නමුත් මුස්ලිම් ජනයා මේ තත්වයෙන් පසුබට නොවූහ. ඔවුහු ලංකාවේ වෙළෙඳාම සම්පූර්ණයෙන් ම පාලනය කිරීමට පටන් ගත්හ. පෘතුගීසින් ලංකාවට පැමිණෙන තෙක්ම මේ තත්වය එසේම විය. ඒ අතර වාරයේ ගම්පොළත් කෝට්ටේ යුගයත් අතර රයිගම රජ කල වීර අලකේෂ්වරයන් ඉස්ලාම් ආගම වැළඳ ගෙන මුස්ලිම් ජනතාව රට අභ්‍යන්තරයේ බලකොටු තනා ගන්නට ද අවසර දුනහ. මහාචාර්ය සෙනරත් පරණවිතානයන් මේ බැව් සඳහන් කරන්නේ මෙසේ ය.

'වීර අලකේෂ්වර පාණදුරේට ඇවිත් එතැන හිටිය මහමදිය වෙළෙන්දන්ගේ උදවු ලබා ගෙන සුවර්ණ පුරයට ගොහින් හිටිය කාලෙදි සුවර්ණ පුරේ විසූ මහමදි ජනයින්* සුවර්ණපුර රාජ්ජෙ පැහැර ගත්හ. වීර අලකේශ්වර මලක්කාවට ඇවිත් එතැන රජ කර සිටිය පරමේශ්වර රජුත් මහමදියෙක් වෙලා ඉන්න බව අහල හැම තැනම මහමදියො බලයට පත් වෙලා ඉන්නවාය තව ටික කලක් ගියා ම ලංකා රාජ්ජයත් ඒ ගොල්ලො අතට ගන්න පුළුවන් වේවිය කියල හිතල බලල තමනුත් මහමදියෙක් වෙන්න පොරොන්දුවක් දීල පරමේශ්වර රජු දීපු බල සෙනගත් කැටිව පානදුර තොටට ගොඩ බැහැල එතැන සිටිය මහමදිය* ජනයින් සමග රයිගම් පුරයට පැමිණිල එතැන සිටිය වීරබාහු ඈපාගේ සේනාපතියනත් සමග යුද කරල එයා පරදවල රයිගම් පුරය අල්ලගෙන එතැන් මහමදිය පල්ලියක් කරවන්න අරඹල ගංපළත් අල්ලගන්න යන්න පිටත්වුණු තැනේදී

---

* මේ වදන මුල් වරට භාවිත කර ඇත්තේ ඉංග්‍රීසීන් විසිනි.



චීන රාජ්ජෙ ඉඳල චෙංහෝ නම් සෙන්පතියා පාණදුර තොටට පැමිණිල ඉන්න බව අහන්න ලැබිල රයිගම් පුරය රැක ගැනීම මහමදියන්ට බාර කරල තමන් ගම්පොළට යන්න රයිගමින් නිකුත් වුණා. චෙංහෝ සෙනවියා මහමදියන් එක්ක යුද්ද කරල උන් පරදවල පලා යවල රයිගම් පුරය අල්ලගෙන ගම්පොළට යන පාර ඉදිරියට පැමිණ හරස් කපා ගෙන ඉඳල වීර අලකේශ්වර සමග යුද කරල එයා පරදවල අල්ලගෙන වීර අලකේශ්වරත් එයාගේ මවත් සෙහොයුරියත් චීන රාජ්ජෙට ගෙන ගියා'. මේ මැදිහත්වීම නිසා දෙවන වරට ද රට මුස්ලිම් වීම වැලකුණි.

ලංකාවට පෘතුගීසින් ආගමනය වන විට පෙර කී මුස්ලිම් ජනයා ලංකාවේ විවිධ තොටුමුණු ආශ්‍රිතව තම වෙළෙඳ බලය තර කර ගෙන සිටියහ. කෝට්ටේ සමයේ දි මායාදුන්නේ හා සීතාවක රාජසිංහයන් මේ මුස්ලිම් ජනයාගෙන් උදව් උපකාර ගෙන පෘතුගීසිනට පහර දුන්ණේ ය. මේ හේතුව නිසා අවසානයේ දී පෘතුගීසින් විසින් ලංකාවේ සිටි ඉන්දීය මුස්ලිම් ජනතාවට පහර දී විනාශ කළහ. මේ නිසා ඔවුන් අවතැන් විය. දෙමළ බස කතා කළ ඔවුහු රැකවරණය පතා සෙනරත් රජු වෙත ගියහ. පෘතුගීසිනට විරුද්ධ සටන්වල දී මුස්ලිම් ජනතාවගෙන් ගත් සහයෝගය නිසා සෙනරත් රජු මේ පිරිස නැගෙනහිර පළාතේ පදිංචි කරවන ලදහ.

1627 දී කොන්ස්ටයින් අධිරාජයා ගත් තීරණයක් නිසා මුස්ලිම් ජනතාව සහමුලින්ම විනාශ කිරීමට පෘතුගීසින් උත්සුක විය. ලන්දේසීන් ලංකාවට පැමිණ බලය අත්පත් කර ගන්නා විට මුස්ලිම් වර්ගයාගේ බලය තිබුණේ ඉතාමත්ම සීමිත ලෙස යි. ඔවුහු මුහුදු බඩ වෙළෙඳාමේ පමණක් යෙදී සිටියහ. මේ මුස්ලිම් වාණිජයන් සමූහ වශයෙන් වෙළෙඳ ව්‍යාපාරවල යෙදී සිටියහ. ඔවුන්ගේ ප්‍රධානතම ව්‍යාපාරය බවට පත්ව තිබුණේ අලි ඇතුන් වෙළෙඳාම යි. මොවුහු ඇතැම්විට මුහුදු කොල්ලකෑමේ ද යෙදී සිටියහ. ආචාර්ය අරසරත්නම් මහතා සිය 'ලන්දෙසි බලය' කෘතියේ මොවුන් ගැන සඳහන් කරන්නේ මෙසේ ය.

'බෙංගාලයෙ සහ ගොල්කොන්ඩාවේ මුස්ලිම් ජනයා ලංකාවේ අලි ඇතුන් කෙරෙහි මහත් සැලකිල්ලක් දැක්වූහ. ලංකාවට නිරන්තරයෙන් අවශ්‍ය වූ සහල් ද තවත් ඒ තරම් වැදගත් නොවූ සීනි ද පට රෙදි සේල වර්ග ද අබිං ද ලංකාවට ගෙන ආහ. මෙසේ මේ වෙළෙඳාම ලංකාවට ඉතා වැදගත් එකක් වූයේ, මෙයින් ලංකාවට අත්‍යවශ්‍ය සහල් ලැබුණු අතර ඒ වෙනුවට ඔවුන් ලංකාවේ අලි ඇතුන් හා පුවක් තම රටවලට ආපසු ගෙන ගිය බැවිනි. මෙය මෙසේ නොවූයේ නම් ඇතුන් පිටරට යැවීමට ලංකාවට කරදර වන්නට ඉඩ තිබුණි. බොහෝවිට ඇතුන්ගේ වටිනාකම ලංකාවට ගෙනෙන ලද සහල්වල වටිනාකමට වැඩි වූයෙන් ලංකාවට වාසි වන පරිදි වැඩි පුර මුදලක් ඉතිරි විය. පහතරට ප්‍රදේශවල අයිතිය තබා ගත් යම් බලවතෙක් වී ද, ඒ බලවතා ඇතුන් වෙළෙඳමේ ද ඒකාධිකාරය අයිතිව සිටියේ ය. ප්‍රධාන වශයෙන් බෙංගාලයේ නවාබ් තුමාත් ගොල්කොන්ඩාවේ රජතුමාත් මොවුන්ට අමතරව, කොරමැන්ඩල් වෙරළේ ඇතැම් සුළු රජවරුන් මේ ඇතුන් මිලදී ගත් අය අතර වූහ'.

අලි ඇතුන් වෙළෙඳාමට අමතරව, ලංකාවේ ප්‍රධාන ආර්ථිකය බවට පත්ව තිබුණේ පුවක් වෙළෙඳාම යි. ලංකාවේ ගම්බද පෙදෙස්වලින් එකතු කරන ලද පුවක් මිලදී ගත්තේ දකුණු ඉන්දීය මරක්කලයන් ය.* ඔවුහු ඉන්දියාවේ සිට සම්පන් නම් යාත්‍රා විශේෂය භාවිත කරමින් ලංකාවට පැමිණ ඉන්දියාවෙන් ගෙනා සහල් සහ රෙදිපිළිවලට මේ පුවක් හුවමාරු කළහ.



දකුණු ඉන්දීය වැසියන් බෙහෙවින්ම පුවක් භාවිත කළ බැවින් මෙලෙස පුවක් වැදගත්



වෙළෙඳ භාණ්ඩයක් විය. මුස්ලිම් ජනයා රජයට සුළු රේන්දයක් ගෙවා මදුරාවත් කොරමැන්ඩලයත් අතර ප්‍රදේශයට පුවක් රැගෙන ගියහ. ඉන්දියාවේ සිට ලංකාවට ගෙන ආ සහල් වලට නම් පට බැඳුණේ ද සම්පන් යාත්‍රා මගින් ප්‍රවාහනය කළ බැවිනි. ඒවා සම්බා වශයෙන් හැඳින්විණ. මේ සහල් වැඩි පුර පරිභෝජනය කළේ රජවරු විසිනි. රොබට් නොකස් කියන පරිදි මුස්ලිම් ජනතාවට එකළ අවශ්‍ය වූයේ, මේ වෙළෙඳාම සම්පූර්ණයෙන් පාලනය කිරීමට පමණි. රට ඇල්ලීමට හෝ වෙනත් කාර්යයකට ඔවුහු අත නොගැසූහ.

පෘතුගීසීන් ගෙන් පසු ලන්දේසීන් 1648 දී පමණ මේ පුවක් වෙළෙඳාම කෙරෙහි මහත් රුචියක් දක්වන්නට පටන් ගත්හ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉන්දියාවත් ලංකාවත් අතර පැවති මේ වැදගත් ආර්ථික ක්‍රමය පිරිහෙන්නට පටන් ගත්තේය. ලන්දේසීහු තමන්ගේ යටත් වැසියන් බණවා පුවක් එකතු කිරීමට අණ කළ අතර කුරුඳු ඒකාධිකාරය මෙන්ම පුවක් ඒකාධිකාරයක් ද ඇති කළහ. මේ වන විට ලංකාවෙන් පුවක් අමුණු 40000 ක් පමණ වාර්ෂිකව ඉන්දියාවට ගෙන යමින් තිබුණු අතර ලන්දේසීන් මැදිහත් වීම නිසා එය 20000ට පමණ අඩු විය. මෙයින් අප තේරුම් ගත යුත්තේ මුස්ලිම් වාණිජයනට ඒ යුගයේ අත්ව තිබූ විශාල බලය යි. කෙසේ වෙතත් 1674 වන විට ලන්දේසීන් මේ වෙළෙඳාම සම්පූර්ණයෙන් ම පාලනය කිරීමට පටන් ගත්හ. ඉන්පසු නාගරික ආර්ථිකය දියුණු කරලීම පිණිස මුස්ලිම් ජනපද ලන්දේසීන් විසින් තහනම් කළහ. එසේම ඔවුන්ගේ ගමන් බිමන් සීමා කළහ. මුස්ලිම් ජනයාට අලුතෙන් කිසිම ඉඩමක් පවරා නොදිය යුතු බවට නීති රීති පැනවිණි. තිබෙන ඉඩම්වල අයිතිය ද නිවැරදිව පෙන්විය යුතු විය. මේ තත්වය නිසා මුස්ලිම් ජනයාගේ බලතල හීන වී ගියහ. වෙළෙඳ ඒකාධිකාරය ද ලන්දේසීන් සතු විය.

ඉංග්‍රීසින් ලංකාවේ බලයට පත් වන විට දකුණු ඉන්දියාවත් ලංකාවත් අතර සුළු වෙළෙඳාම අත්පත්ව තිබුණේ නායක්වරුන්ට යි. ඔවුහු ලන්දේසීන්ගේ ද


ආශිර්වාදය ඇතිව මේ ආර්ථිකය පවත්වා ගෙන ගියහ. නමුත් 1815 දී ශ්‍රී වික්‍රම රාජසිංහයන් බ්‍රිතාන්‍යයන් අතට පත් වීමත් නායක්වරුනට ලංකාව තහනම් කිරීමත් හේතු කොට ගෙන මුස්ලිම් වාණිජයනට නැවතත් අවස්ථාව ලැබුණි. බ්‍රිතාන්‍යයන් යළි වෙළෙඳාම නිදහස් කළහ. මුස්ලිම් ජනතාව නව බ්‍රිතාන්‍ය පාලනයේ විශ්වාසය දිනා ගනිමින් වෙළෙඳාම කරන අතරවාරයේම මුස්ලිම් ජනපද පිහිටුවාලීමට පටන් ගත්හ.

1818 ජාතික විමුක්ති සටන අවස්ථාවේදී මුස්ලිම් ජනයා ඉංග්‍රීසින්ට උදව් කළ අතර කැප්පෙටිපොළ නිලමේ පරවහගම ප්‍රදේශයේදී පාවා දීමට කටයුතු කරන ලද්දේ ද මුස්ලිම් වෙළෙන්දෙකු විසිනි. මෙම පාවාදීම වෙනුවෙන් සහ මුස්ලිම් ජනයාගේ රාජපාක්ෂික භාවය වෙනුවෙන් ප්‍රතිඋපකාර වශයෙන් උඩරට පළාත්වලට අදාළව විශේෂ සැලකිලි දක්වන බවටත් එම සැලකිලි උඩරට ප්‍රධානීන්ට නොමැති බවත් සඳහන් කරමින් රොබට් බ්‍රවුරිග් ආණ්ඩුකාරවරයා 1818 මාර්තු 02 දා ප්‍රකාශනයක් නිකුත් කර ඇත.* මෙතෙක් ඔවුන්ගේ ජනපද වශයෙන් තිබුණේ ඉතාමත් සීමිත ස්ථාන කීපයක් පමණකි. බණ්ඩාරගම අටුලුගම, ගම්පොළ, නැගෙනහිර පළාත, පුත්තලම වැනි සීමිත ස්ථාන කීපයක පමණක් ඔවුන් සංක්‍රමණිකයන් වශයෙන් රැඳී සිටියහ. නමුත් ඉංග්‍රීසින් මේ ක්‍රමය වෙනස් කරමින් 1821 දී පමණ ඔවුන්ට පුරවැසිකම ප්‍රදානය කළහ. ලංකාවේ වර්තමාන මුස්ලිම් බලය නැග ඒමේ ආරම්භය මෙයයි. 1981 වන විට ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක ම මුස්ලිම් ජනගහනය වර්ධනය තිබූ අතර පුත්තලම නුවර වැනි පෙදෙස්වල විශාල වශයෙන් ජනගහන වර්ධනයක් දක්නට හැකි විය.

* 1818 මාර්තු 07 රජයේ ගැසට් පත්‍රය



* මරක්කල මිනිසුන්ගේ රාජපාක්ෂික භාවය උතුම්කොට සලකන බවත් එයට ප්‍රතිඋපකාර වශයෙන් ඔවුන්ට විශේෂ සැලකිලි දක්වන බවත් පළකරමින් රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරතුමා විසින් නිකුත් කළ මුල් ආඥාපත්‍රයේ ඡායාරූපයක්



PROCLAMATION.

By His Excellency Lieutenant General Sir Robert Brownrigg Baronet and Knight Grand Cross of the Most Honorable Military Order of the Bath Governor and Commander in Chief in and over the British Settlements and Territories in the Island of Ceylon with the Dependencies thereof.

ROBT. BROWNRIGG

WHEREAS the British Government has on various occasions experienced the fidelity of the Moormen resident in these Provinces—We taking, the same into Our serious consideration and being desirous to mark to them that we duly estimate their attachment, do hereby declare and enact that from and after the Publication of this Our Proclamation in the several Districts of the Kandyan Provinces it shall not be lawful for any Kandyan Chief to exercise any Jurisdiction whatever over the Moormen of this Country, and that Civil and Criminal Justice shall in future in all Cases where a Moorman is a Party, be impartially administered to them by British Officers only, in manner that shall be hereafter arranged and that the Mohandirams over the several Mudege Departments shall in future receive their Appointments direct from the Principal Accredited Agent of the British Government in Kandy.

And We do hereby further promise that every Moorman who may suffer in His Person or Property by his adherence to the British Government, shall receive the fullest compensation the nature of the Injury will admit of.

We trust that the Moormen will duly appreciate the Benefits herein granted and held out to them and that they will earnestly and zealously aid and assist in putting down the present daring Rebellion and We order them on their Allegiance & at their Peril to refrain from joining the Persons now traitorously in Arms against His Majesty the King of Great Britain and to oppose them by all means in their Power.

Given at Kandy in the said Island of Ceylon this Second day of March One Thousand Eight Hundred and Eighteen.

By His Excellency's Command
(Signed) GEO: LUSIGNAN
Sec. Kand. Provs.

GOD SAVE THE KING.

ආශ්‍රිත ග්‍රන්ථ :


1. වයඹ ලංකා රාජධානි- එන්.ටී.කරුණාතිලක
2. ලංකාවේ ලන්දේසි බලය - අර්සරත්නම්
3. ගම්පොළ යුගය- සාහිත්‍ය කලාපය
4. අල්ජිහාද් අල්කයිඩා - පාඨලී චම්පික රණවක